# ප්‍රාදේශීය සභා සංවර්ධන කමිටුව

**ප්‍රාදේශීය සභා පනතට අනුව පිහිටුවාගත් ප්‍රාදේශීය සභාවේ සංවර්ධන කමිටුව ප්‍රාදේශීය සභා සංවර්ධන කමිටුව නම්වේ.**

## *සංයුතිය*

- මෙම කමිටුව ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරුන් 30% ක් සහ ප්‍රජා නියෝජිතයන් 70% කගෙන් සමන්විත වී ඇත.
- මෙම කමිටුව නියෝජනය කිරීම සඳහා ප්‍රජා නියෝජිතයින් තෝරාගනු ලබන්නේ කලාපීය මහා සභාවෙනි. කලාප විධායක කමිටු සාමාජිකයින් ප්‍රාදේශීය සභා සංවර්ධන කමිටුව නියෝජනය කරති. ප්‍රාදේශීය සභාව විසින් ප්‍රාදේශීය සභාව නියෝජනය කිරීම සඳහා 30% මන්ත්‍රීවරුන්ගෙන් තෝරා පත්කරනු ලැබේ.
- ප්‍රාදේශීය සභා සංවර්ධන කමිටුවේ මුළු සාමාජික සංඛ්‍යාව තීරණය කරනු ලබන්නේ ප්‍රාදේශීය සභාවේ නියෝජන ප්‍රතිශතය වන 30% සඳහා මන්ත්‍රීවරුන් තෝරා පත්කර ගත් පසුවය. සියලුම කලාප ආවරණය වන ආකාරයට මන්ත්‍රීවරුන් තෝරා පත්කරගනු ලැබේ. එසේ තෝරා පත්කරගන්නා මන්ත්‍රී සංඛ්‍යාව පදනම් කරගෙන එක් එක් කලාපයෙන් තේරී පත්විය යුතු ප්‍රජා නියෝජිත සංඛ්‍යාව තීරණය කරනු ලැබේ(70%). පත් කළහොත් ප්‍රජා නියෝජනය

## *රැස්වීම්*

ප්‍රාදේශීය සභා සංවර්ධන කමිටුව ආරම්භයේ දී මාස දෙකකට වරක් වත් රැස්විය යුතු අතර, ආයතන ශක්තිමත් කිරීමේ සැලසුම සහ උප ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම ආරම්භ කළ පසු අවශ්‍යතාවය අනුව නිතර රැස්වීම් පවත්වනු ලැබේ.

## *වගකීම්*

ප්‍රාදේශීය සභාව විසින් අතුරු ව්‍යවස්ථාවක් සම්මත කරගැනීමෙන් මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට අවශ්‍යවන පහත සඳහන් වගකීම් ප්‍රාදේශීය සභා සංවර්ධන කමිටුවට පවරා දෙනු ලැබේ.

- ප්‍රාදේශීය සභා අන්තර ගම්මාන සම්බන්ධතා සංවර්ධන සැලසුම සකස් කිරීම.
- ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා වෙන්වූ බැංකු ගිණුමක් ආරම්භ කිරීම හා ක්‍රියාත්මක කිරීමට
- මූල්‍ය කමිටුව, ප්‍රසම්පාදන කමිටුව, ආයතන සංවර්ධන කමිටුව හා පරිසර කමිටුව පත්කිරීම.
- උප ව්‍යාපෘති යෝජනා ක්‍රියාත්මක කිරීම සඳහා කලාප විධායක කමිටු සමග අවබෝධතා ගිවිසුම් (MOU 2) අත්සන් කිරීම සහ අවශ්‍ය අරමුදල් යොමු කිරීම.
- අන්තර ගම්මාන සම්බන්ධතා සැලැස්මට අනුකූලව උප ව්‍යාපෘති යෝජනා සහ වියදම් ඇස්තමේන්තු අනුමත කිරීම
- උප ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා කලාපීය විධායක කමිටුවලට මගපෙන්වීම/උපදෙස් දීම.
- උප ව්‍යාපාති ක්‍රියාත්මක කිරීම සඳහා කර ඇති වියදම් අනුමත කිරීම
- ක්‍රියාත්මක කිරීමේ කටයුතුවලට අදාළ වූ සියලු පොත්පත් හා වාර්තා පවත්වාගෙන යාම
- අනුමත සීමාවන් ඇතුළත මිලදී ගැනීම් කටයුතු ඉටුකිරීම.
- කලාප කමිටුවලින් මිලදී ගත් වැඩ සහ ද්‍රව්‍ය පරීක්ෂාකර බැලීම සහ එම මිලදී ගැනීම් ව්‍යාපෘතියේ අනුමත උප ව්‍යාපෘති අවශ්‍යතා සමග ගැලපේදැයි පරීක්ෂා කිරීම.

- යම් කලාප කමිටුවක් විසින්, කේවල් කළ නොහැකි මූලධර්ම, මෙහෙයුම් අත්පොතේ දක්වා ඇති උපදෙස්, අවබෝධතා ගිවිසුමේ කොන්දේසි ආදිය කඩකිරීම සහ මූල්‍යමය වැරදි සිදුකර ඇත්නම් එවැනි ව්‍යාපෘති කටයුතු තාවකාලිකව නතර කිරීම.
- උප ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ කටයුතු පසු විපරම් කිරීම
- උප ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය සහ මූල්‍ය තොරතුරු ප්‍රාදේශීය සභාවට ව්‍යාපෘතිය සහ ආර්ථික සංවර්ධන අමාත්‍යංශයට වාර්තා කිරීම.
- ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ කටයුතුවලදී කලාප කමිටුවලට පළාත් සභාව, මහවැලි අධිකාරිය වැනි ආයතනවලින් අවශ්‍යවන අනුමැතින් හා අනුඥාතකිරීම් ලබාගැනීමට සහාය වීම. ආයතන ශක්තිමත් කිරීමේ සැලසුම අනුමත කිරීම සහ ප්‍රගතිය පිළිබඳ පසු විපරම් කිරීම.
- ආයතනය ශක්තිමත් කිරීමේ කමිටුව තුළින් ආයතන ශක්තිමත් කිරීමේ සැලසුම ක්‍රියාත්මක කිරීම

## ***<u>ප්‍රාදේශීය සභා සංවර්ධන කමිටුවේ නිලතල දරනු ලබන්නේ</u>***

- ප්‍රාදේශීය සභාවේ සභාපති ප්‍රාදේශීය සභා සංවර්ධන කමිටුවේද සභාපති වේ.
- ප්‍රාදේශීය සභාවේ ලේකම් ප්‍රාදේශීය සභා සංවර්ධන කමිටුවේද ලේකම් වේ.
- භාණ්ඩාගාරික විය යුත්තේ ප්‍රජා සාමාජිකයින් අතුරින් තෝරාගත් කාන්තාවකි.
- එක් උප සභාපතිවරයකු සහ සහකාර ලේකම්වරු දෙදෙනෙකු ප්‍රජා සමාජිකයින් අතුරින් තෝරාගත යුතුවේ.
- ප්‍රාදේශීය සභා සංවර්ධන කමිටුව නිසියාකාරව ක්‍රියාත්මක කිරීම සඳහා ප්‍රාදේශීය සභා සංවර්ධන කමිටුව තුළින් **ආයතන ශක්තිමත් කිරීම, ප්‍රසම්පාදන, මූල්‍ය සහ පරිසර යන අනු කමිටු 04ක්** සකස් කොට එම කමිටු වලට නිලධාරීන් පත් කළ යුතුය.
- **ප්‍රාදේශීය සභා සංවර්ධන කමිටුවේ කටයුතු සමාජ විගණනය කිරීම සඳහා සමාජ විගණන කමිටුවක්** සියළුම කලාපීය සමාජ විගණන කමිටුවල කැඳවුම්කරුවන්ගෙන් සකස් කරගනු ලැබේ. කලාප සභා විසින් ඍජුවම කලාප මට්ටමේ සමාජ විගණන කමිටු පිහිටුවා ගනු ලැබේ.
- ප්‍රජාවගෙන් තෝරාගනු ලබන සාමාජිකයින්ගෙන් අවම වශයෙන් 50%ක් වත් කාන්තාවන් විය යුතුය.

## ප්‍රාදේශීය සභා සංවර්ධන කමිටුව නිසියාකාරව ක්‍රියාත්මක කිරීම සඳහා සකස් කර ගත් අනු කමිටු

### 1. ආයතන ශක්තිමත් කිරීමේ කමිටුව

ප්‍රාදේශීය සභාවේ සභාපතිගේ නායකත්වයෙන් යුතු උප කමිටුවක් සකස් කරගනු ලබන අතර එය ආයතනය ශක්තිමත් කිරීමේ අරමුදලට අදාල ක්‍රියාකාරකම් සැලසුම් කිරීමේ හා ක්‍රියාත්මක කිරීමේ වගකීම දරනු ලබයි.

***<u>සංයුතිය</u>***

- මෙම කමිටුව නියෝජනය කළ යුතු සාමාජික සංඛ්‍යාව පිළිබඳව ප්‍රාදේශීය සභා සංවර්ධන කමිටුව විසින් තීරණය කළ හැකිවේ.
- ප්‍රාදේශීය සභාවේ සභාපති හා ලේකම්ට පිළිවෙලින් මෙම කමිටුවේද එම තනතුරු දැරිය හැකිවේ.
- මෙහි සාමාජිකත්වයෙන් 50%ක් ප්‍රජාව විසින් නියෝජනය කළ යුතුවේ.

***වගකීම්***

- ආයතනය ශක්තිමත් කිරීමේ අවශ්‍යතා හඳුනාගැනීම සහ ප්‍රාදේශීය සභා සංවර්ධන කමිටුවට ආයතන ශක්තිමත් කිරීමේ සැලසුම සකස් කිරීමට සහාය වීම.
- ආයතනය ශක්තිමත් කිරීමේ සැලසුම ක්‍රියාත්මක කිරීමට ප්‍රාදේශීය සභා සංවර්ධන කමිටුවට සහායවීම.
- ප්‍රාදේශීය සභා කාර්ය මණ්ඩලයේ, ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරුන්ගේ සහ කමිටු සාමාජිකයින්ගේ හැකියාවන් වර්ධනය කිරීමට සහ ඔවුන් තුළ ආකල්පමය වෙනසක් ඇතිකර ධනාත්මක චින්තනයට යොමුකිරීමට හැකිවන සේ පුහුණු වැඩසටහන් සහ ක්ෂේත්‍ර චාරිකා සංවිධානය කිරීම සහ මෙහෙයවීම. මෙම පුහුණු වැඩ සටහන්වලට ගිණුම් පටිපාටින්, ප්‍රජා පාලිත සංවර්ධන ක්‍රමවේදය, තොරතුරු තාක්ෂණය, භාෂාමය හැකියාවන් වර්ධනය (ඉංග්‍රීසි සහ වෙනත් අදාළ භාෂාවන්) ආදිය ඇතුලත් කළ හැකිවේ.
- විවිධ වූ කමිටුවල සහ ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරුන්ගේ හැකියාවර්ධන අවශ්‍යතා හඳුනාගැනීම, සැලසුම් කිරීම හා හැකියාවර්ධන අවස්ථා ක්‍රියාත්මක කිරීම.
- ආයතනය ශක්තිමත් කිරීමේ සැලැස්ම පිළිබඳ ප්‍රගති වාර්තා සකස් කිරීම සඳහා ප්‍රාදේශීය සභා සංවර්ධන කමිටුවට සහායවීම.

## 2. ප්‍රාදේශීය සභා මට්ටමේ මූල්‍ය කමිටුව

මූල්‍ය කටයුතුවලදී සහායවීම සඳහා ප්‍රාදේශීය සභා සංවර්ධන කමිටුවට මූල්‍ය කමිටුවක් සකස් කරගනු ලැබේ.

***සංයුතිය***

මෙම කමිටුවේ සාමාජිකත්වය 3-5 දක්වා වන අතර, සභාපති තනතුර ප්‍රාදේශීය සභාවේ ලේකම්වරයා විසින් දරනු ලැබේ. ප්‍රාදේශීය සභා සංවර්ධන කමිටුවේ භාණ්ඩාගාරික මෙම මූල්‍ය කමිටුවේ කැඳවුම්කරු වේ.

***රැස්වීම්***

මසකට වරක්වත් රැස්විය යුතුවේ.

***වගකීම්***

- ප්‍රාදේශීය සභා සංවර්ධන කමිටුවට ගිණුම් පොත් පැවැත්වීම සඳහා සහායවීම.
- කලාප විධායක කමිටුවලට ගිණුම් පොත් පැවත්වීම සඳහා මගපෙන්වීම.
- ප්‍රාදේශීය සභා සංවර්ධන කමිටුවට මූල්‍ය ප්‍රගති වාර්තා සකස් කිරීමට සහාය ලබාදීම.
- ප්‍රාදේශීය සභා සංවර්ධන කමිටුවෙහි අයවැය සකස් කිරීමට සහ විගණන කටයුතු ආදියට සහායවීම.
- පවරනු ලැබු බලතල වලට අනුව වියදම් අනුමත කිරීම.

## 3. ප්‍රසම්පාදන කමිටුව (මිලදී ගැනීම් කමිටුව)

### *සංයුතිය*

සාමාජිකයන් 3-5 දක්වා විය යුතුය. ප්‍රාදේශීය සභාවේ සභාපති විසින් සභාපති තනතුර දරනු ලැබේ. ප්‍රජා නියෝජිතයකු මෙහි කැඳවුම්කරු විය යුතුය.

### *රැස්වීම්*

මාස 02කට වරක්වත් රැස්විය යුතුය.

### *වගකීම්*

- ප්‍රාදේශීය සභා සංවර්ධන කමිටුවට ලංසු ලියකියවිලි සකස් කිරීම, නිකුත් කිරීම, විවෘත කිරීම වාර්තාකරණය සහ ලංසු අගැයීම කොන්ත්‍රාත්දීම සැපයුම් පිළිබඳව සොයා බැලීම ආදී වූ සියලුම මිලදී ගැනීම්වලට කටයුතු වලට සහායවීම.
- කලාප කමිටුවලට සියළුම මිලදී ගැනීම් කටයුතු සඳහා මඟ පෙන්වීම.
- ආයතන ශක්තිමත් කිරීමේ සැලසුම සඳහා මිලදී ගැනීම් සැලසුම සකස් කිරීම සහ අන්තර සම්බන්ධතා උප ව්‍යාපෘතීන් සඳහා මිලදී ගැනීම් සැලසුම සකස් කිරීමට කලාපීය මිලදී ගැනීම් කමිටුවලට මඟ පෙන්වීම.
- මිලදී ගැනීම් සැලසුම් පිළිබඳව අගැයුම් මෙහෙයුම් කණ්ඩායමට අවශ්‍ය වන පැහැදිලි කිරීම් සැපයීම.
- පිරිවිතර, ප්‍රමිතීන්, අගැයුම් නිර්ණායක, ලංසු කැඳවීම් හා කොන්ත්‍රාත් ලිපි ලේඛණ ආදිය පිළිබඳව තාක්ෂණ අගැයුම් කමිටුවේ නිර්දේශවලට එකඟවීම් හා ක්‍රියාත්මක කිරීම.
- ක්‍රියාත්මක කෙරෙන සියලුම උප ව්‍යාපෘතින්වලට අදාළ වූ සියලුම මිලදීගැනීම් කටයුතු පසු විපරම් කිරීම සහ මිලදී ගැනීමේ සැලසුම් අවශ්‍ය පරිදි යාවත්කාලීන කෙරෙන බව තහවුරු කිරීම.
- ප්‍රාදේශීය සභා සංවර්ධන කමිටුවට සියළුම මිලදී ගැනීම් ගොනු හා වාර්තා පවත්වාගෙන යාම සඳහා සහායවීම.

## 4. පරිසර කමිටුව

ප්‍රාදේශීය සභා සංවර්ධන කමිටුවේ පරිසර කමිටුව මගින් සියළුම අන්තර ගම්මාන උප ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේදී පාරිසරික බලපෑම් ඇතිවීමට ඇති ඉඩ වැළැක්වීමේ පාරිසරික ආරක්ෂණ වැඩපිළිවෙලක් අනුගමනය කරන බව තහවුරු කරනු ලැබේ.

### *සංයුතිය*

- ප්‍රාදේශීය සභා සංවර්ධන කමිටුව විසින් ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරයකු ඇතුළත් වන සේ සාමාජිකයින් 05 දෙනෙකු පාරිසරික කමිටුව සකස් කරගැනීම සඳහා නම් කරනු ලැබේ.

- පහත සඳහන් නිලධාරීන් පරිසර කමිටුවේ නිත්‍ය ආරාධිතයින් ලෙස නම්කර ඇත.
- ප්‍රාදේශීය සභාවේ / ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ පාරිසරික නිලධාරී
- ප්‍රාදේශීය සභාවේ / ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ තාක්ෂණ නිලධාරී
- වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ අඩවි නිලධාරී
- වන ජීවී දෙපාර්තමේන්තුවෙහි අඩවි නිලධාරී
- කමිටුවේ සාමාජිකත්වය දරන ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරයා පරිසර කමිටුවේ සභාපතිත්වය දරනු ඇත. ප්‍රජා නියෝජිතයකු සම සභාපතිවරයකු වනු ඇත. ප්‍රාදේශීය සභා / ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ පාරිසරික නිලධාරියා නිල බලයෙන් මෙම කමිටුවේ කැඳවුම්කරු වේ.

***වගකීම්***

පරිසර කමිටුවට පහත දැක්වෙන වගකීම අයත් වේ.

- ප්‍රාදේශීය සභාවේ, කලාප සභාවේ සහ කලාප කමිටුවල සාමාජිකයින්ට උප ව්‍යාපෘතීන්හි පාරිසරික කරුණු කාරණා පිළිබඳ දැනුවත් කිරීම.
- උප ව්‍යාපෘති ගොනු පිළියෙල කිරීමේදී එම ව්‍යාපෘතියට අදාළ කිසියම් අහිතකර පාරිසරික බලපෑමක් ඇතිවිය හැකිනම් ඒවා හඳුනා ගැනීමත් ඒවා වළක්වා ගැනීමට අවශ්‍ය පියවර ගැනීම සඳහාත් කලාප කමිටුවට මග පෙන්වීම
- එකී වළක්වා ගැනීම් සඳහා පිළියෙල කර ඇති සැලසුම් සහ ක්‍රියාත්මක වැඩසටහන් පසු විපරම් කිරීම එකී කටයුතු නිසි පරිදි ඉටුවන බව තහවුරු කිරීම.
- පාරිසරික බලපෑම් පිළිබඳ අගැයීම් කළ යුතු අවස්ථාවලදී මධ්‍යම පරිසර අධිකාරිය හෝ අගැයීම් සහ මෙහෙයුම් කණ්ඩායම් සමග සහසම්බන්ධතාවයක් ගොඩනගමින් අවශ්‍ය දායකත්වය සැපයීම.

## ප්‍රාදේශීය සභා සංවර්ධන කමිටුවේ සමාජ විගණන කමිටුව

ප්‍රාදේශීය සභා සංවර්ධන කමිටුවේ සමාජ විගණන කමිටුව පත්කරනු ලබන්නේ ප්‍රාදේශීය සභා මට්ටමේ සමාජ විගණන කටයුතු ඉටුකිරීමට සහ එමගින් සොයාගන්නා කරුණු නිවැරදි කිරීමේ නිර්දේශ සහිතව වාර්තා කිරීම සඳහාය. මෙහි අරමුණ වනුයේ අරමුදල් අපේක්ෂිත කාරණාවන් සඳහාම වියදම් කළ බව තහවුරු කරගැනීමයි. එහිදී කේවල් කළ නොහැකි මූලධර්ම සහ මෙම මෙහෙයුම් අත්පොතේ උපදෙස් වලට අනුකූලව කටයුතු කළ බව තහවුරු කරගැනීම සමාජ විගණනයෙන් සිදුකරයි.

***සංයුතිය***

සමාජ විගණන කමිටුව මට්ටම දෙකක පිහිටා තිබේ. එකක් ප්‍රාදේශීය සභා මට්ටමින්ද, අනික කලාප මට්ටමින්ද වශයෙනි.

- ප්‍රාදේශීය සභා සංවර්ධන කමිටුවේ සමාජ විගණන කමිටුව සමන්විත වනුයේ සියළුම කලාප මට්ටමේ සමාජ විගණන කමිටුවල කැඳවුම්කරුවන්ගෙනි.
- සමාජ විගණන කමිටු සාමාජිකයින් තෝරාගැනීමේ නිර්නායක වනුයේ

- ප්‍රාදේශීය සභා මට්ටමේ හෝ කලාප මට්ටමේ වෙනත් කමිටුවක සාමාජිකයකු නොවීම.
- ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරයෙකුගේ, කාර්ය මණ්ඩලයේ හෝ ප්‍රාදේශීය සභා සහ කලාප මට්ටමේ කමිටු සාමාජිකයින්ගේ සමීප ඥාතියකු නොවීම.
- ග්‍රාමීය මට්ටමේ සමාජ විගණන කමිටුවක අවම වශයෙන් වසර 1ක් වත් කටයුතු කර ලැබූ පළපුරුදුකම් තිබීම.
- අවංක බව හා ඍජු බව පිළිබඳව ප්‍රසිද්ධියට පත් කෙනෙකු වීම සහ සෑම කෙනෙකුටම පිළිගත හැකි ආකාරයේ කෙනෙකු වීම.
- පරමාදර්ශ සහ කේවෙල් කළ නොහැකි ව්‍යාපෘති මූල ධර්ම කඩ නොකළ අයෙකුවීම.

## ***රැස්වීම්***

අවම වශයෙන් මාස දෙකකට වරක් සහ අවශ්‍ය අවස්ථා වලදී රැස්විය යුතුවේ.

## ***වගකීම්***

- ප්‍රාදේශීය සභා සංවර්ධන කමිටුවේ, කලාප විධායක කමිටුවේ, ආයතන ශක්තිමත් කිරීමේ කමිටුවේ, ප්‍රාදේශීය සභා සංවර්ධන කමිටුවේ, ප්‍රසම්පාදන හා මූල්‍ය කමිටුවේ ක්‍රියාකාරකම් පිළිබඳව පරීක්ෂාකර බැලීම සහ සියළුම අදාළ කමිටුවල ගිණුම් පොත් හා වවුචර ප්‍රසම්පාදන වාර්තා ආදිය විගණනය කිරීම සහ කේවල් කළ නොහැකි මූලධර්ම, මෙහෙයුම් අත්පොතේ සඳහන් කරඇති උපදෙස් පිළිපදින බව තහවුරු කිරීම.

- අන්තර සම්බන්ධතා උප ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ ගුණාත්මක භාවය පරීක්ෂා කිරීම.

- ආයතන ශක්තිමත් කිරීමේ සැලසුමේ ක්‍රියාකාරකම් පිළිබඳව සමාජ විගණනය.

- උපදෙස් හා මඟ පෙන්වීම වලින් වෙනස්ව කටයුතු කිරීම් හෝ කේවෙල් කළ නොහැකි ව්‍යාපෘති මූල ධර්ම කඩකිරීම් පිළිබඳව ඒවා නිවැරදි කිරීම් සඳහා අනුගමනය කළයුතු ක්‍රියා මාර්ග ඇතුළත් නිර්දේශයන්ද සහිතව ප්‍රාදේශීය සභා සංවර්ධන කමිටුවට වාර්තා කිරීම.

- ඉඩම් අත්පත් කරගැනීමේ කටයුතු පරීක්ෂා කර බලා සමාජ රැකවරණය සඳහා වන ප්‍රතිපත්තීන් පිළිපැද ඇතිබව තහවුරු කිරීම.